# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 144/17 — 1975 ජනවාරි 03 වැනි සිකුරාදා — 1975.01.03

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

අංක සී. 555 දරණ ආහාර මිල නියෝගය — කිරිඟු පිටි

**මිල පාලන පනත**

4 වැනි වගන්තිය යටතේ නියෝගය

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විල්ප්‍රඩ් ජයසූරිය වන මම, (173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1974 අගෝස්තු මස 01 වැනි දින අංක 122/65 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1974 අගෝස්තු මස 01 වැනි දින අංක සී. 544 දරණ ආහාර මිල නියෝගය 1975 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර පහත සඳහන් පරිදි මෙයින් අණ කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයන් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී සහ සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී කොළඹ නගරයේ නාගරික සීමාවන ඇතුළත විකිණිය හැකි වැඩිම මිල 1975 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙ උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍යය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍ය කින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිල පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිල ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍යය සඳහා "රාත්තල" නොහොත් "රා." යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණනු සෑම තැනැත්තකු විසින්ම මිලයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යන වග ;

ඇතුළත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණනු විට ඒ විකුණන ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිලත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිල ගණන්වලට ඇතුළත් වන බව ද නියම කරමි.

1975 ජනවාරි මස 01 වැනි දින ප.ව. 4 ට, කොළඹ දී අත්සන් කරන ලදී.

විල්ප්‍රඩ් ජයසූරිය,
මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය).

උපලේඛනය

| 1 වැනි තීරය විස්තරය | 2 වැනි තීරය ශුද්ධ බර හොණ්ඩර එකක් (රා. 112ක්) තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 3 වැනි තීරය ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| (i) තිරිඟු පිටි (සලාකයට) ... ... ... | 117 72 ... | 1 10 |
| (ii) තිරිඟු පිටි (සලාකයෙන් බැහැරව) ... ... ... | 122 04 ... | 1 10 |

සටහන — මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිල නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ ගණන් වේ. එම මිළ ගණන්වලට වැඩියෙන් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

1—404

සී. 556 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය | අතිරේක ආහාර ද්‍රව්‍ය—කොත්තමල්ලි

මිළ පාලන පනත

4 වැනි වගන්තිය යටතේ ආඥාව

මිළ පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විල්ප්‍රඩ් ජයසූරිය වන මම, (173 වැනි අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1974 ජූලි මස 26 වැනි දින අංක 121/9 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1974 ජූලි මස 25 වැනි දින අංක සී 543 දරණ ආහාර මිළ නියෝගය වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයක් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍ය කින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩි මිළ, උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණනු සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළෙඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන්ද

යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන්නී ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබෙ නම්, එහි මිළත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1975 ජනවාරි මස 02 වැනි දින ප.ව. 3.30ට, කොළඹ දී අත්සන් කරන ලදී.

විල්ප්‍රඩ් ජයසූරිය,
මිළපාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය).

උපලේඛනය

| 1 වැනි තීරය වර්ගය | 2 වැනි තීරය තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 3 වැනි තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| කොත්තමල්ලි ... ... ... ... | 100 0 ... | 1 10 |

සැලකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මෙවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

1—110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී